සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2020.12.24 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2020/06 (නව) දෙවන එකතුව**

සියළුම සමෘද්ධි බැංකුපාලක මණ්ඩල/ බැංකු සමිති සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති කළමණාකරුවන් ,

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක කරන "සමෘද්ධි නිලදරු" ණය යෝජනා ක්‍රමය</u>

01. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක "සමෘද්ධි නිලදරු" ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලි අනුපාතයන් ඇතුළු අනිකුත් මඟ පෙන්වීම් සංශෝධනය කිරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2020/77/02 හා 2020/78/06 යටතේ ලබාදුන් උපදෙස් අනුව ඉදිරියට ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපදෙස් ලබාදීමට මෙම නව එකතුව නිකුත් කරන බව දන්වමි.

02. 2021.01.01 දින සිට "සමෘද්ධි නිලදරු" ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලි අනුපාතය 9.5% සිට 7% දක්වා අඩු කළ බව දන්වන අතර, ඒ අනුව පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

2.1 නව පොලි අනුපාතයන් දැනටමත් පිටහිටි සහ නව ණය නිකුත් කිරීම් සඳහා වලංගු වේ.

2.2 මෙම නව වාර්ෂික පොලි අනුපාත අනුව 2021.01.01 දිනට පිටහිටි ණය මුදලට වාරිකය සකස් කළ ගත යුතුවේ.

2.3 2020 දෙසැම්බර් මසට අදාල මාසික ණය වාරිකය 2021.01.01 දිනට පසු ලැබුනු විටක නව පොලි අනුපාතය යටතේ මාසික ණය වාරිකය සකස් කිරිමේදී 2020 දෙසැම්බර් මසට අදාල චෙක්පතෙහි සඳහන් ණය වාරිකය අඩු කල පසු 2021 ජනවාරි මසට ඇති පිටහිටි ණය මුදලට නව පොලිය ගණනය කිරීම සිදු කල යුතුය.

2.3 ඒ අනුව, පිටහිටි ණයකරුවන්ගේ පිටහිටි ණය මුදල (රු) නව වාර්ෂික පොලි අනුපාතය සහ ගෙවීමට ඇති ගිවිසුම්ගත කාලය ඇතුලත් කර, නව මාසික වාරිකය සකස් කල යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

ඒ සඳහා, මුල් චක්‍රලේඛයේ ඡේද අංක 09 හි ඇමුණුම් 06 ආකෘතිය භාවිතා කර, නව මාසික ණය වාරිකය සකස් කර ගත යුතුය. උදාහරණ :- යම් නිලධාරියෙකු රු. 1,000,000/- ණය මුදලක් මාස 180 ආපසු ගෙවීමට ලබාගෙන 2021.01.01 දිනට පිටහිටි ණය මුදල රු. 987777/- කි. ණයගෙවීමට ඇති ඉතිරි ගිවිසුම් කාලය මාස 176 කි. ඇමුණුම් 01 හි සඳහන් පරිදි මාසික නව ණය වාරිකය රු. 9551/- කි.

2.4 මෙම උපදෙස් අනුව නව මාසික ණය වාරිකය සකස් කර, වැටුප් සකස් කරන කාර්යාලය වෙත කඩිනමින් යැවීමට කටයුතු කරන ලෙසත්, ණය ගොනුවට සකස් කල නව මාසික ණය වාරිකයට අදාල පිටපතක් ඇතුලත් කරන ලෙසත් දන්වමි.

2.5 2020 වර්ෂය තුල, ගෙවීමට ඇති ණය වාරික සඳහා 9.5% පොලී අනුපාතය අනුව පොලිය ගණනය කළ යුතුය.

03. චක්‍රලේඛ අංක 2020/06 නව හි ඡේද අංක 8.3.1 III හි පරිදි බැංකු සමිතිය විසින් බැංකු මඟින් 2020.12.31 දිනට පෙර ලබාගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීම් කාලය මාස 60 සිට මාස 84 දක්වා වැඩි කර ඇත. තවද, එසේ කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය බැංකු සමිති විසින්, විධායක කමිටු නිර්දේශ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.